සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	ඉස්ලාම් ධර්මය I,II	කාලය நேரம் Time: පැය 03 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, ප්‍රශ්න සංවිධානය කිරීමටත් යොදා ගන්න.

උපදෙස් :

- ❖ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 දක්වා නිවැරදි හෝ සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ❖ පිළිතුරු පත්‍රයේ පිළිතුරට ගැළපෙන අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

I කොටස

1. අල් මාඋන් තාහිර් හි අඩංගු ජලය,
   1) උල්පත් ජලය 2) මුහුදු ජලය 3) තැඹිලි 4) වැසි ජලය

2. මුස්ලිම්වරයෙකුගේ ක්‍රියාවන් අල්ලාහ් වෙත යොමු වීමට ප්‍රධාන කොන්දේසිය,
   1) වරද 2) තව්බා 3) ඊමාන් 4) ඉහ්ලාස්

3. විශාල ජල තටාකයක ජලය එක්රැස් වී පාසි වර්ධනය වී එම ජලයෙහි පාට වෙනස් වී ඇත.
   මෙම ජලයෙන්,
   1) වුළු කළ හැක 2) වුළු කළ නොහැක
   3) වුළු නොකර සිටීම යෝග්‍ය වේ 4) වුළු කර පිරිසිදු ජලයෙන් නැවත සිදු කිරීම

4. නජීස් වැටුණු කිරි භාවිතා කිරීමේ දී ආගමික නීතිය වනුයේ,
   1) එය භාවිතා කළ හැක.
   2) නජීස් වූ දෙය පිරිසිදු කළ නොහැක.
   3) නජීසය වැටුණු සීමාව ඉවත් කොට ඉතිරිය භාවිතා කළ හැක.
   4) ආහාර හැර සෙසු දේ භාවිතා කළ හැක.

5. ''සුන්නාහ්ව ඉස්ලාමයේ ප්‍රධාන නීති මූලාශ්‍රයකි.'' යන්නට හේතුව,
   1) අල්ලාහ් නබිතුමාව පිළිපදින මෙන් අණ කර තිබීම.
   2) සහාබාවරු නබිතුමාව පිළිපැද තිබීම.
   3) හදීස් ආරක්ෂා කොට පැවතීම.
   4) හදීසය සියල්ලන් අනුගමනය කිරීම.

6. අල්කුර්ආනය පාරායණා කිරීමට නබිතුමා පෙන්වාදුන් ක්‍රමවේදය,
   1) තර්තීබුන් තිලාවත් 2) තර්තීබුන් නුසූල් 3) තර්තීබුන් නස්ර් 4) තර්තීබු තූරා

Past Papers Wiki

7. උස්මාන් (රලි) කාලයේ නාවික හමුදාව ස්ථාපිත කළේ,
1) අලි (රලි) ය 2) මුආවියා (රලි) ය 3) තල්හා (රලි) ය 4) සුබෙර් (රලි) ය

8. විවාහකයා හැඳින්වීමට අල්කුර්ආන්හි භාවිතා වන පදය,
1) සව්ජ් 2) මුහ්සන් 3) කාලි 4) වලී

9. රජුගේ ව්‍යාපාර උපදේශක මණ්ඩලයට මුස්ලිම්වරු සතර දෙනෙක් පත් කරන ලද්දේ,
1) ශ්‍රී වික්‍රමසිංහ රාජසිංහ 2) I බුවනෙකබාහු 3) විජයබාහු 4) මහා පරාක්‍රමබාහු

10. කුරෙෂිවරුන්ගේ පීඩන නිසා නබිතුමා තම මිත්‍රයන්ව යවන ලද රට,
1) මිසරය 2) බහ්රෙන් 3) යෙමනය 4) ඇබිසිනියාව

11. 'අ' සහ 'ආ' සම්බන්ධ කරන්න.

අ	ආ
1) ඉමාම් මාලික් (රහ්)	A කිතාබුල් බුහාරි
2) ඉමාම් මුහම්මද් ඉබ්නු ඉස්මායීල් (රහ්)	B කිතාබ් සීරත් රසූලුල්ලාහ්
3) ඉමාම් ෂාෆිඊ (රහ්)	C කිතාබුල් මුවත්තා
4) ඉමාම් මුහම්මද් බින් ඉස්හාක් (රහ්)	D කිතාබ් අල් උම්මු

1) BCDA 2) CABD 3) CADB 4) DBAC

12. ඉස්ලාම් මධ්‍යස්ථභාවය හඳුන්වනුයේ,
1) රබ්බානීය්‍යා 2) වසතීය්‍යා 3) සුමුලිය්‍යා 4) ආලමීය්‍යා

13. හජ් සහ උම්රා සඳහා වෙන් වෙන්ව නිය්‍යත් තැබීම,
1) කිරාන් 2) ඉෆ්රාද් 3) රමන් 4) තමත්තුඋ

14. ''හික්මා'' පිළිබඳව ඉමාම් ෂාෆිඊගේ මතය වනුයේ එය,
1) අල්කුර්ආන් ය 2) නබිවරුන්ගේ ඉතිහාසය යි
3) සුන්නාහ් ය 4) සහාබාවරුන්ගේ අදහස් ය

15. මනමාලයෙකු හට විවාහවීමට අනුමැතිය ලද කාන්තාව,
1) භාර්යාවගේ දියණිය 2) පුංචි අම්මාගේ දියණිය
3) පුතාගේ භාර්යාව 4) සහෝදරියගේ දියණිය

16. සලාතයේ පාරායණය අනිවාර්ය වූවකි,
1) දුආඋල් ඉෆ්තිතාහ් 2) ආයතුල් කුර්සි
3) සලවාතුල් ඉබ්රාහිමිය්‍යා 4) සූරතුල් ඉහ්ලාස්

17. අල්ලාහ් සහ ඔහුගේ දූතයා යුද්ධ කිරීමට සූදානම් වන පාපය,
1) දූෂණය 2) සැඟවීම 3) පොළිය 4) දුරාචාරය

18. අබූබක්කර් (රලි) තුමා වෙත අල්කුර්ආනය ග්‍රන්ථකරණය සඳහා යෝජනා කළ සහාබිවරයා,
1) සෙද් (රලි) 2) හුදෙෆා යමානි (රලි) 3) මුආද් (රලි) 4) උමර් (රලි)

19. 'අ' සහ 'ආ' සම්බන්ධ කරන්න.

අ	ආ
1) අල් උර්ෆු	A සහාබාවරුන්ගේ ප්‍රකාශ
2) අල් කියාස්	B සමාජ යහපත
3) කෞලුස් සහාබි	C සම්ප්‍රදාය
4) මස්ලහා මුර්සලා	D සැසඳීම

1) DCBA 2) CDBA 3) CDAB 4) DCAB

20. හදීස් ග්‍රන්ථකරණය සඳහා ප්‍රමුඛතාව ලබාදුන් කලීෆාවරයා,
1) උමර් ඉබ්නු කත්තාබ් (රලි) 2) අබුබක්කර් මුහම්මද්
3) ෂිහාබුද්දීන් සුහ්රි 4) උමර් ඉබ්නු අබ්දුල් අසීස්

21. ''වෙළඳාම්, ව්‍යාපාර නීතිය නොදන්නා වෙළෙඳපළට නොපැමිණෙන්න.'' මෙම ප්‍රකාශය සිදුකළේ
1) උමර් (රලි) ය 2) අලි (රලි) ය 3) මුආවියා (රලි) ය 4) උස්මාන් (රලි) ය

22. මුහම්මද් නබි (සල්) තුමාව හඟවන වචනය වනුයේ,
1) රබ්බුන් නාස් 2) රහ්මතුන් ලිල් ආලමීන් 3) රබ්බුල් ආලමීන් 4) හුදන් ලින්නාස්

23. කාමිල් අසර් සලාතය ජමාඅත්ව ඉටුකිරීම සඳහා මස්ජිදයට යමින් සිටියේය. එම අවස්ථාවෙහි මෝටර් සයිකල් අනතුරක් සිදුවිණි. ෆික්හුල් අව්ලවියාත් හැදෑරූ ඔහුගේ තීරණය පහත පරිදි විය යුතුය.
1) ජමාඅත්ව සලාතය ඉටුකිරීමට මස්ජිදයට යාම. 2) රෝගියාව රෝහලට රැගෙන යාම.
3) සිදුවීම නොදැකී අයෙකු සේ ගමන් කිරීම. 4) අන් අය සිටින නිසා මස්ජිදයට යාම.

24. ''මටත් වඩා කවි කීමට ලොවෙහි කිසිවෙකුත් නොමැත. නමුත් මුහම්මද්ගේ වචන යනු මිහිරිය; ලාලිත්‍ය ය; එහි මතුපිට ඉමිහිරිය; ඇතුළත සෞභාග්‍යය ය.'' මෙම ප්‍රකාශය,
1) ලබීද්ගේ ය. 2) ඉම්රුල් කෙස්ගේ ය.
3) අබූජහ්ල්ගේ ය. 4) වලීද් ඉබ්නු මුගීරාගේ ය

25. හදීස් හි මූලික අදහස විග්‍රහ කරනුයේ,
1) ඉස්නාද් 2) ආහාද් 3) මත්න් 4) සනද්

26. බෙඅතුෂ් ෂජරා ගිවිසුම් අත්සන් කරන ලද්දේ,
1) හිජ්රි 4 2) හිජ්රි 5 3) හිජ්රි 6 4) හිජ්රි 7

27. D.S. සේනානායක මැතිතුමාගේ ඇමති මණ්ඩලයේ කම්කරු ඇමති තනතුර හෙබවූයේ,
1) M.C. සිද්ධි ලෙබ්බෙ ය 2) T.B. ජායා ය 3) වාපිච්චි මරික්කාර්ය 4) M.A.M. අසීස් ය

28. ඉමාම් ෂාෆිඊ් (රහ්)ගේ උපන් ස්ථානය,
1) මදීනා 2) කූෆා 3) බග්ඩෑඩ් 4) ගාසා

29. නිවැරදි ප්‍රකාශය තෝරන්න,
1) කුල්ලතෙන්වලට වඩා අධික ජලය ''මාඋන් කලීල්'' වේ.
2) ''ජාමිඋල් බයාන්'' යනු උස්මාන් (රලි) තුමා ය.
3) මනමාලිය, මනමාලයාට මහර් ලබාදිය යුතු ය.
4) හිජ්රි 13හි උමර් (රලි) කලීෆා බවට පත්විය.

30. හජ් හි වාජිබ් වූ තවාෆය,
1) තවාෆුල් කුදූම් 2) තවාෆුල් ඉෆාලා 3) තවාෆුල් විදා 4) තවාෆුල් වදා

31. රාජ්‍ය කුමන්ත්‍රණවලින් ඊමානය ආරක්ෂා කරගත් තරුණයන් පිළිබඳව සඳහන් සූරාව,
1) කහ්ෆ් 2) බකරා 3) මාඉදා 4) නිසා

32. ආර්ථිකයෙහි විශ්වාසය සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණ වන්නේ,
1) අල්ලාහ්ට ස්තුතිය පුද කිරීම. 2) වැය සහ ඉතිරියේ දී මධ්‍යස්ථවීම.
3) පෞද්ගලික දේපලෙහි කොටසක් සමාජයට අයත් ය. 4) පොළිය අන්තර්ගත නොවීම.

33. ඉන්දියාවේ සින්දු ප්‍රදේශය ජයගත් තරුණයා,
1) තාරික් බින් සියාද් ය 2) හජ්ජාන් බින් යූසුෆ් ය
3) අක්බර් රජු ය 4) මුහම්මදු ඉබ්නු කාසිම් ය

34. සලාතයෙහි ''ඉය්යාක නඃබුදු වඉය්යාක නස්තඊන්'' යන්නෙහි අර්ථය,

1) විනිශ්ච දින අධිපති
2) ඔබව නමදිමු. ඔබගෙන්ම පිහිට පතමු.
3) අපට ඍජු මාර්ගය පෙන්වනු.
4) මහා කාරුණික, පරම දයාබර

35. බහුතර මුජ්තහීද්වරුන්ගේ ඉජ්මාව,

1) ඉජ්මාඋස් සරීහ
2) ඉජ්මාඋල් අක්සරිය්යා
3) ඉජ්මාඋස් සුකූති
4) ඉජ්මාඋ මුරක්කබ්

36. නබි (සල්) තුමා සුබහ් සලාතයෙන් පසු ප්‍රාර්ථනා කළ දේ,

1) බියගුළුකමින් සහ මසුරුකමින් ආරක්ෂාව
2) ධන සම්පත්තිය සහ දීර්ඝායුෂ
3) ප්‍රයෝජනවත් අධ්‍යාපනය, හලාල් වූ ආහාර සහ පිළිගත් අමල්
4) ස්වර්ගයට ප්‍රවිශ්ඨීය සහ නිරයෙන් විමුක්තිය

37. මුස්ලිම්වරයෙකු සතුව ඕනෑම අයහපත් ගුණාංගයක් තිබිය හැක. නමුත් මෙම ගුණාංග දෙක තිබිය නොහැක යැයි නබිතුමා ප්‍රකාශ කළේ ය. එය,

1) බොරුව, වංකබව
2) පොළිය, දුරාචාරය
3) සොරකම, බොරුව
4) දූෂණය, සොරකම

38. ''මා කුස පුරවා ආහාර ගැනීමෙන් දුප්පතාගේ කුසගින්න අමතක ''වේ දෝ'' යැයි බියවෙමි'' යන ප්‍රකාශය,

1) යූසුෆ් (අලෙ)ගේ ය
2) ඊසා (අලෙ)ගේ ය
3) දාවුද් (අලෙ)ගේ ය
4) යඃකූබ් (අලෙ)ගේ ය

39. ''හජ් අනිවාර්ය වූ අවස්ථාවෙහි මාගේ පියා මරණයට පත්විය. මා හට ඔහු වෙනුවෙන් හජ් ඉටු කළ හැකි ද?'' මෙම නීති මූලාශ්‍රය,

1) අල්කුර්ආන්
2) හදීස්
3) ඉජ්මා
4) කියාස්

40. කාන්තාවකගේ ඔසප් කාලයෙහි ඇයට දික්කසාදය පැවසීම,

1) තලාක් බාඉන්
2) තලාක් රජ්ඉ
3) තලාක් සුන්නි
4) තලාක් බිදඉ

(2 × 20 = ලකුණු 40)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	ඉස්ලාම් ධර්මය I,II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

II කොටස

උපදෙස් :

- **පළමු** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

(01) 1) පිරිසිදුකමහි වැදගත්කම පිළිබඳ **හදීසයක්** ලියන්න.

2) ''අර්රූහානියත්'' හි අන්තර්ගතයන් **දෙකක්** ලියන්න.

3) ධනය සම්බන්ධ ඉබාදත් **දෙකක්** ලියන්න.

4) තයම්මුම් සිදුකරන අවස්ථා **දෙකක්** නම් කරන්න.

5) තිදෙනෙකුගේ ඇස් නිරය නොදකී. ඉන් කාණ්ඩ **දෙකක්** නම් කරන්න.

6) මක්කා, මදීනා හි පැරණි නම් ලියන්න.

7) ඉද්දා හි අරමුණු **දෙකක්** ලියන්න.

8) ඉස්ලාම් කාන්තාවන්ට ලබා දී ඇති අයිතිවාසිකම් **දෙකක්** ලියන්න.

9) ලංකාවට ඉස්ලාමය පැමිණීම පිළිබඳ සඳහන් අරාබි ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

10) සුන්නත් වූ නැමදුම් වලින් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

(2 × 10 = ලකුණු 20)

(02) 1) ජමාඅත් සලාතයෙහි ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

2) සාමූහික සකාත් හි ප්‍රයෝජන **තුනක්** දක්වන්න.

3) හජ් හි ප්‍රධාන ස්ථාන පහක් නම් කර එහි සිදුකරන ක්‍රියාවන් දක්වන්න.

(2+3+5 = ලකුණු 10)

(03) 1) ''කියාස්'' නිර්වචනය කරන්න.

2) ඉජ්මා හි වර්ග **තුනක්** ලියන්න.

3) කියාස් හි අර්කාන් නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

PAST PAPERS WIKI

(2+3+5 = ලකුණු 10)

(04) 1) ''ඉහ්ලාස්, තස්කියා'' යන්නෙහි අරුත් දක්වන්න.

2) සූරතුල් ෆුර්කාන්හි දේවගැත්තන්ගේ ගුණාංග **තුනක්** නම් කරන්න.

3) ''තව්බා'' යන්න හඳුන්වා එහි කොන්දේසි දක්වන්න.

(2+3+5 = ලකුණු 10)

(05) 1) ව්‍යාපාර සහ පොළිය අතර වෙනස්කම් **දෙකක්** ලියන්න.

2) ඉස්ලාමීය ආර්ථිකයෙහි සුවිශේෂතා **තුනක්** ලියන්න.

3) ඉස්ලාම් අනුමත ව්‍යාපාර ක්‍රම **සතරක්** සඳහන් කර ඉන් **දෙකක්** විග්‍රහ කරන්න.

(2+3+5 = ලකුණු 10)

(06) 1) අරාබි ව්‍යාපාරිකයන් ලංකාවට පැමිණීමට හේතු **දෙකක්** ලියන්න.

2) නබි (සල්) තුමාගේ මුල්කාලීන මාධ්‍යයන් **තුනක්** දක්වන්න.

3) ලංකාවෙහි දේශීය යහපත වෙනුවෙන් මුස්ලිම්වරුන්ගේ දායකත්වයන් කෙටියෙන් දක්වන්න.

(2+3+5 = ලකුණු 10)

(07) පහත මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i) අල්කුර්ආන්හි ආශ්චර්යන්

ii) උමර් (රළි)ගේ සේවාවන්

iii) ලෞකික ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දැක්ම

iv) T.B. ජායා

(5 + 5 = ලකුණු 10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank